# සාරාංශය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා කොහා විවෘත මූලාශ්‍ර මෘදුකාංගය ස්ථාපනයේදී හා භාවිතයේදී මුහුණ පෑමට සිදුවන ගැටලු හඳුනාගැනීම මෙම පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ යි. මෙහිදී හඳුනාගත් ගැටලු සඳහා විශ්වසනීය විසඳුම් ඉදිරිපත් කිරීමට ද උත්සාහ ගෙන තිබේ. කොහා භාවිත විශ්වවිද්‍යාල ප්‍රධාන පුස්තකාල 10 ක් මෙහි සංගහනය වූ අතර සමස්ත සංගහනය ම අධ්‍යයන නියැදියට ඇතුළත් විය. පුස්තකාල අතර ප්‍රාථමික දත්ත එක්රැස් කිරීම සඳහා සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදා ගැණුනි. මීට අතරව සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණ වැනි ක්‍රම ද භාවිත කරන ලදි. අධ්‍යයන ප්‍රතිඵලවලට අනුව ස්ථාපනයට හා පවත්වාගෙනයාමට අඩු පිරිවැයක් දැරීම, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව තිබීම, වාණිජ මෘදුකාංගවල මිල අධික වීම යනාදී හේතු නිසා පුස්තකාල කොහා මෘදුකාංගය වෙත අනුගතව තිබේ. 40% ක් පුස්තකාල කොහා ස්ථාපනය පුස්තකාල කාර්යමණ්ඩලයේ අයෙකු මගින් සිදුකර ගෙන තිබූ අතර 60% ක් පුස්තකාල බාහිර සේවා දායකයෙකු යටතේ සිදුකරගෙන තිබුණි. පුස්තකාල කාර්යමණ්ඩලයේ අයෙකු මගින් ස්ථාපනය සිදුකරගත් 50% ක් පුස්තකාලවලට ස්ථාපනය ආශ්‍රිතව ගැටලු ඇතිව තිබූ අතර 50% ක් පුස්තකාල සඳහා කිසිදු ගැටලුවක් ඇතිව නොතිබුණි. එමෙන්ම බාහිර සේවා දායකයෙකු මගින් ස්ථාපනය සිදුකරගත් පුස්තකාල අතුරින් 83.3% ක ප්‍රමාණයකට ගැටලු ඇතිව තිබූ අතර 16.7% ක් පුස්තකාල සඳහා කිසිදු ගැටලුවක් ඇතිව නොතිබුණි. කොහා භාවිතය ආශ්‍රිතව අධ්‍යයනය කිරීමේ දී 40% ක් පුස්තකාල එහි මොඩියුල සියල්ල ම භාවිත කරන අතර 60% ක් ප්‍රතිග්‍රහණ, සංසරණ හා වාර සඟරා පාලන මොඩියුල හැර අනෙකුත් මොඩියුල සියල්ලක්ම භාවිත කරයි. කොහා සම්බන්ධ පාඨමාලාවන්ගේ හිඟය, නිසි මාර්ගෝපදේශ රහිතවීම, ප්‍රායෝගික පුහුණුව හා පුහුණු කාලය ප්‍රමාණවත්ව නොලැබීම විශ්වවිද්‍යාල පුස්තකාල තුළ කොහා භාවිතය තුළ පැන නැගී ඇති ප්‍රධාන ගැටලු ලෙස අණාවරණය විය. ඒ අනුව නිරීක්ෂණ සහ සොයාගැනීම් මත පදනම්ව ගැටලු අවම කරගැනීම සඳහා අවශ්‍ය සුදුසු විසඳුම් සහ යෝජනා ද ඉදිරිපත් කර තිබේ.

**ප්‍රමුඛ පද:**

පුස්තකාල ස්වයංක්‍රීයකරණය, කොහා, විවෘත මූලාශ්‍ර මෘදුකාංග, අන්තර් පුස්තකාල පද්ධති, විශ්වවිද්‍යාලයීය පුස්තකාල